පොල්

මාරුක්, නෙරළු, නාරිකේල ආදී නම් වලින් හැඳින්වෙන පොල්, තවසි, බෝදිලි, කුන්දිරා, රන්තැඹිලි, ගොන්තැඹිලි, තඹුතෙල්, නිල්පොල්, රතුපොල් ආදී වර්ග කීපයකට අයත් වේ. ආර්ථික වගාවක් හැටියටත් පාරිභෝගික වගාවක් හැටියටත් පොල් ලංකාව පුරා පැතිරී ඇත. විශේෂයෙන් පේරාදෙණිය උද්භිද උද්‍යානයේ දෙබිඩි පොල් නමින් හැඳින්වෙන යෝධ පොල් විශේෂයක්ද ලඟදී බෝකරගෙන ඇත. සමුද්‍රාසන්න ලවන මිශ්‍ර අවසාදිත වැලිපත් සහිත තීරය පොල් වාගවට ගිතකරය. කොළඹ, හලාවත, කුරුණෑගල යන නගර වලින් සීමාවන පොල් ත්‍රිකෝණයත්, මුහුදුබඩ බිම් තීරුවත් ලංකාවේ ආර්ථික පොල් වගා ප්‍රදේශයි. ඒ හැර හැම ගෙවත්තකම පරිභෝජනය අරමුණු කරගෙන පොල්ගස් කීපයක් වත් වගා කරගැනීමට ලක්වැසි ජනතාව උනන්දු වෙති. මීගමුවට නුදුරු ලුණුවිල බණ්ඩිරිප්පුවේ පොල් පර්යේෂණ මධ්‍යස්ථානයක් වේ. නුවරඑළිය, හපුතලේ, බණ්ඩාරවෙල, හැටන් වැනි කඳුකර ශීත ප්‍රදේශ පමණක් පොල් වගාවට ගිතකර නොවේ.

පොල්පිටිය, පොල්ගස්වත්ත, පොල්ගස්ඕවිට, පොල්ගහවෙල, පොල්ගොල්ල, පොල්හේන්ගොඩ, තැඹිලියාන, පොල්පිතිගම වැනි ග්‍රාම නාමයන්ට මුල් වී ඇත්තේ පොල් වගාවයි. මෙය ලාංකිකයන්ගේ එදිනෙදා ආහාර වේලට අත්‍යවශ්‍ය අංගයක් හැටියට පත් වී තිබේ. කිරිබතට, මැල්ලුමට, වැංජනයට, සම්බෝලයට, කිරිහොද්දට, බැදුමට පමණක් නොව කැවුම්, කොකිස්, වැළිතලෙප, දොදොල්, ආප්ප, රොටි, පිට්ටු ආදී දේශීය කැවිලි වර්ග පිළියෙළ කිරීමේදීත් පොල් නැතිවම බැරිය. පොදු හිස ගැල්ලුමක් හැටියටද පොල්තෙල් නිතර භාවිතා වේ. කුරුම්බාව, වෑවටය මිගිරි පානයකි. එය පවස නිවා සුවය සදයි. කුරුම්බා ලොඳයද සා පවස නිවාලයි. සිරුරේ විජලනය නැති කරයි. නොපැසුණු පොල් කලටි නම් වේ. පොල් මලෙන් ගන්නා තෙල්දිය (තෙලිජ්ජ) පැණි හකුරු කර්මාන්තයට යොදා ගනු ලැබේ. පොල් රා ගැමියන්ගේ මෘදු මද්‍ය පානයකි. එයින් නිපදවන අරක්කු තද මත්පැනකි. පරණ කළ කල්දේරම් අරක්කු සමහරු අගය කරති. කසිප්පු වැනි නීතියෙන් බැහැරව නිපදවන මද්‍යසාරය ද පොල් රා වලින් පෙරා ගනු ලැබේ.

ආරයකි. පොල්ලිය ගොඩනැගිලිවල වහල සඳහාත්, විවිධ කටයුම් හා ගෘහ උපකරණ තැනීමටත් උපයෝගී වේ. පොල් කටු වලින් කලාකරුවෝ උසස් නිර්මාණ කරති. පොල් ඉරටු වලින් ඉදල් තැනේ. වට්ටි වැනි ගෘහ උපකරණද නිපදවේ. පොල් කොනු වලින් ලුනු, කඹ, මුසුන්, පාපිසි, බුරුසු, මෙට්ට ආදී උපකරණ තනා ගැනේ. කොනුබත් වලින් පවා විවිධ ප්‍රයෝජන ගනු ලැබේ. වියලි පොල් අතු දියේ දමා පොඟවා වියා වහල සෙවිලි කිරීමට ගත හැකිය. ගැමි කාන්තාව ගොක්කොල තම්බා වේලා මලු, පැදුරු, මාගල් ආදිය වියා ගැනීමට පෙළඹේ. කඩපලෙන් එළවළු, පළතුරු ආදිය ගෙනයාමටත්, පන්සලට දන් ගෙනයාමටත්, කුඹුරට අඹුල ගෙනයාමටත් පොල්කොල ඇසුරෙන් වියා ගන්නා ලද පිරිවැස්ස වෙනුවට අද පරිසරයට අහිතකර සිලිඬෑගය පැමිණ තිබීම අවාසනාවකි. පොල්කටු හැන්ද අදත් ගැමිකත කුස්සියේදී භාවිතා කරන උපකරණයකි. ප්‍රයෝජනයක් නොගෙන ඉවතලිය හැකි කිසිම කොටසක් පොල් ගසේ නොමැති බව සැලකිය යුත්තකි.

බලි තොවිල් වලදීත් ගම්මඬු, දෙවොල්මඩු ආදියේදීත් ගොක් කොළයෙන් කෙරෙන සැරසිලි විස්මයජනකයි. ගැමියන් පිරිත් මණ්ඩප, මඟුල් මඩු, මඟුල් පෝරු, තොරණ සරසන්නේ

"මලේ මලේ තැඹිලිය වැන්න පොල් මලේ "

තවද විනාකිරි නම් වූ අම්ලය නිපදවා ගන්නේත් පොල් රා වලිනි.

පොල්මල, පොල්බඩ, පොල්රා, පොල්පැණි, පොල්කිරි, පොල්කහකඩ, පොල්වතුර ආදිය ආයුර්වේද ඖෂධ සඳහා යොදා ගැනේ. ආහාර විෂවීමක් වැනි අවස්ථාවකදී ඇඟ කැසීමක් ඇතිවූ විට අමු පොල්කොල දුම් අළල්ලීමෙන් සුවය ලැබේ. අසේ රෝග ඇති වූ විට කුරුම්බා වතුර ඇසට දැමීම ට අපි පුරුදු වී සිටිමු. පොළොන් විෂ ශරීර ගතවූ විට තැඹිලි වතුර බොන්නට දෙනු ලැබේ.

නාරිකෙල ඵලං සනි ගධං"පිත්ත ඝනං සාදු ශීතලම්
ගුරු මාංශ පුදං හෘද්‍යං"වාමණම් වසති සොධනම්"
"සාරාර්ථ සංග්‍රහය"

පිත නසන, මස්වඩන, සිරුරු තරකරන, ලයට හිත පොල්මදය සිසිල්ය, සිනිඳුය."

බාලං කෙර ඵලං හෘද්‍යං"ලවණං පිත්ත දාහනුත් තජ්ජලං ජවරං පිත්තාසු"හරං ලඝුව රේචනම්" "සාරාර්ථ සංග්‍රහය"

"ලවණ රස වෘවර ලොඳ පිත දැවිල්ල පහ කරයි. එම ජලය උණ පිත ලේ සමනය කරයි. විරේචන කාරකයකි."

නාරි කෙලස්‍ය පුෂ්පතතු"ශීතං රක්තාතිසාර හෘත් රක්ත පිත්තං ප්‍රමේහංච"සොම රොගං නාසයෙත් " "සාරාර්ථ සංග්‍රහය"

සිසිල් ගුණ ඇති පොල් තෙල්, කොප්පරා, කපාවේලු පොල් අපනයනය කෙරේ. තෙල් සිඳගෙන ඉතිරිවන පුන්නක්කුව සත්ව ආහාරයකි. තෙල් සිඳීමේ උපකරණය සෙක්කුවයි. පොල්ලෙලි, හනසු, පිති, කටු, ලි ඉන්ධන වශයෙන් පිරිමසුම් දායකය. ඉවතලන පොල්රොඩු පවා සත්ව ආහ-

ගොක්කොල ඇසුරෙනි. පුන් කලස තුළ දමන පොල් මල සෞභාග්‍යයේ සංකේතය වැන්න. දෙනයන් සිහිකර තනන මල්පැල, පූජාතලු, හා ගොටු සරසන්නේත් ගොක්කොලයෙනි. පොල් තෙලෙන් දැවෙන පන්දම හා විලක්කුව බලි තොවිල් ආදියේදී අත්‍යවශ්‍ය උපකරණයි. පෙරහර වලදී ආලෝකය සඳහා දල්වන්නට භාවිතා වූයේ කොප්පරාය. උත්සව ආරම්භයේදීත් ගෙයකට ගෙවදිමේදීත් පොල්තෙල් පහන් දැල්වීම විශේෂ චාරිත්‍රයකි. බුදුන් දෙවියන් වෙනුවෙන් දැල්වෙන්නේ පොල්තෙල් පහනයි. පෝදාප පන්සල් බිමේ සියගණන් දහස්ගණන් පහන් දැල්වේ. වෙසක් පෝදාට ගෙවල් අසල පොල්තෙල් පහන් දැල්වීම සිරිතකි. ගැමියෝ ලෙලි රහිත පොල්ගෙඩික් දෙවොල ඉදිරිපිට ගලේ ගසා දේව ආශීර්වාදය අපේක්ෂා කරති. මංගල යුවලක් පෝරුවෙන් බසිනවිට පොල්ගෙඩි දෙකක් පෝරුව දෙපස බිම තබා බිඳීම චාරිත්‍රයකි. බලි තොවිල් වලදී ආතුරයාගේ පයට පොල් ගෙඩියක් තැබීම චාරිත්‍රයකි. බලි යාගවලදී ඇදුරෝ පොල් ගෙඩියේ උපත පිළිබඳව මෙබඳු කවි ගායනා කරති.

"පළමු අපි මුනිඳු ට
වසවතු කරපු විනයට
දෙව් රැස්වි එතැනට
නැතිව සිටියයි එපොල් යාගෙට

රන් තැඹිලි පොල් ගැන
කොයි රට ඇත්ද ඇසු තැන
සත් මුහුද එදෙසින
රැගෙන ආ රන් තැඹිලි මෙලෙසින

එරන් පොල් ගෙනෙනට
යන්නේ කවුද ඇසුවිට
නන්දන රුසි එවිට
ගෙනත් දුන්නයි එපොල් යාගෙට

ගණිඳු අවතාරෙන්
නාරිකේලද විලසින්

උපත දැන නියමින්
එරන් තැඹිලියෙ උපත පවසන්

සත් මුහුදක් ඇත එතෙර එදේසින
ඉරුගල් බිසවගෙ කුසෙන් උපන් තැන
ගණදෙවියෝ දුන් කිරුළිස දරමින
සත්දින පසුවී පැලපත දකිමින

යුදෙන් වැටුණු ගණ දෙවියන්ගේ හිස
ගොසින් වැටුණි මහ හිමයේ හිසිලෙස
මෙලෙසින් සක් රජ දකිමින් තුටු ලෙස
විගසින් ඇටකටු තරකර මෙම ලෙස

දිනෙන් දිනට වැඩිවිය පැමිණෙන්නේ
මුදුන ඉරා අතු ගොබ නිල්වන්නේ
රියන් පමණ කැකුලයි හටගන්නේ
ගොසින් වාත සුළඟට නඳ දෙන්නේ

හරියට තුන්මස ගිය තැන ඉසිරෙති
එළියට වනමල් ඉති අග බරවෙති
පිරියට මි මැසි බමරෝ නදදෙති
හරියට පොල් සිවු වගයක් පළගති

පළමුව රන් තැඹිලිය නම් පොල් වෙති
දෙවනුව ගොන් තැඹිලිය නම් පොල් වෙති
තුන්වැනි නවසිඳ බෝදිලි පළගති
සමසක් ගියතැන පොල්ගෙඩි මෝරති

තුන්නෙත් ගණදෙවි කිරුළිස දරනා
දුන්නෙත් මේ පොල් ගණදෙවි විසිනා
පන්තිස් යාගය ඇදුරෝ දෙසනා
පොල් ගෙඩියට හැම දෝෂය බසිනා

මෙකී දෙවිඳුගෙන් වරමුත් ලැබගෙන
දුකී දුරුර පොකුරඹ පත විලසින
අට අනුරෝගද පිරිපත දුරලන
මේ දොස හැර පොල් දෙපය තබවු දැන"
"ජනකවි"



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

පොල් මල් අතට රැගෙන ආවේශ වෙමින් මල මල් සේය.

"නොපුබුදු තැඹිලි මල්
ඇගෙ දඟ යුගට මනකල්
පැරඳ සැඟවුණු තුල්
කොපුළ ඇතුළට පිවිසි හැමකල් "

දඹදෙණියේ දෙවන පැරකුම්බා මහ රජුගේ දේව ප්‍රතිරාජ නම් ඇමතිවරයා කළුතොට පටන් බෙන්තොට දක්වා යොදනක් මානයෙහි නිවී ගැවසී සිටිනා සේ පරාක්‍රමබාහු නම් නාලිකෙරොද්‍යානයක් කරවා රජුට දන්වා යැවූ බව පූජාවලියේ උද්දේසික පූජා නම් වූ සූතියේ වන පරිච්ඡේදයේ දැක්වේ. අත්තිඩිය " පානදුරය අතරදී එදා මග දෙපස වූ පොල් උයන් හංස සංදේශකරු මෙසේ දකිති.

සබඳ මඳක් තැන්ගිය මග දකුණු පසේ
විහිඳ තිබෙන වලුබර පොල් උයන් රැසේ
නොමඳ තරඟ පහරට බියව නොකම සේ
මුහුදු කැලුම් රැස්වූ වැන්න වෙරළ සේ

කෑරගල වෙහෙර වටා වූ පොල්වතු ඔහු මෙසේ ස්වභාවෝක්තියට නගයි.

දිමුත් වෙහෙර වට විසිතුරු මල් ව වතුය
එහිත් සුවඳ මල් නිතිවෙයි මිණි මුතුය
මහත් තුරු මියුරු පලදෙන නැමි අතුය
රැගත් සෙවන නොහැරව සිටි පොල් වතුය

"තල්පක් වලින් පොල් පක් පතන්නාසේ" යන උපමාව සද්ධර්ම රත්නාවලිය ලියූ ධර්මසේන හාමුදුරුවෝ ලියා තැබූහ. රුහුණේ ජන කවියෙක් පොල්වලු බැඳ සකස්කළ තොරණක් මෙසේ දැක ඇත.

ගෙනෙන ගෙනෙන වලු"තොරණ බඳිනවලු
තොරණ බඳිනවලු "නැටි පරවෙනවලු
නැටි පරවෙනවලු "බිමට නැමෙනවලු
බිමට වැටෙනවලු "කොල්ලෝ කනවලු"

දේශීය සංස්කෘතිය හා නිතැතින්ම බැඳී පැවතුණු පොල් වගාව අප රටේ සීඝයෙන් පරිහානිය කරා යන හැටි පෙනේ. ගොඩනැගිලි ඉදි කිරීම, පාරවල් පළල් කිරීම, විශාල කම්මල් ඉදිකිරීම, ඉඩම් කැබලි කර විකිණීම ආදිය නිසා කපා දමන පොල් ගස් සංඛ්‍යාව අසීමිතය. ඒ හැර තද ඉඩෝරයේදීත් කෘමි වසංගත වලදීත් ස්වභාවිකව මිය යන පොල් ගස් සංඛ්‍යාවද විශාලය. ඊතියා කාර්මික සංවර්ධනය නිසා ජාතියේ ජීවය බඳු පොල් වගාවේ අනාගතය සංවේගදායක බව කාගේත් අවධානයට යොමුවිය යුත්තකි.